# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2020.03. 05 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) – 11/2019 (i)**

දකුණු පළාත් සභාවේ සියළුම

ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා

ගණන්දීමේ නිලධාරීන් වෙත,

**ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම පිළිබඳව 2019.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 11/2019 ට අතිරේක වශයෙනි.

දකුණු පළාත් සභාවට අයත් ආයතන වල ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, නිර්දේශ කිරීම හා අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදුව, ඒ සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/2/1/3/19 හා 2019.07.25 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 05/2019 නිකුත් කරන ලදී. තවද වඩාත් කාර්යක්ෂම සේවයක් සඳහා 2019.11.30 දින ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ පැවැත්වූ සාකච්ඡාවේදී තීරණය කරන ලද පරිදි, ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/2/1/1/2019 හා 2019.12.27 දිනැති ලිපියෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව 2019.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 11/2019 නිකුත් කරන ලදී.

එම චක්‍රලේඛයෙහි 3.2 ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල යටතේ ඇති වගුවෙහි අංක 8 යටතේ, ඇස්තමේන්තු මූල්‍ය සීමාව රු.ලක්ෂ 10ට අඩු ඇස්තමේන්තු නිර්දේශ කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියුතු III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරීන්ට හා පුහුණු ශ්‍රේණියේ නිලධාරීන්ටද ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදුව, පහත ආකාරයට එම වගන්තිය සංශෝධනය


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.



"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2020.02.25 දින ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/2/1/1/දීමනා හා 2020.02.27 දිනැති ලිපියෙන් දන්වා එවා ඇති බව කාරුණිකව දන්වමි. (එම ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)

3.2 **ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල.**

| අනු අංක | ඇස්තමේන්තු මුල්‍ය සීමාව (රු) | ඇස්තමේන්තු සකස් කිරීම | නිර්දේශ කිරීම |
|---|---|---|---|
| 8. | ලක්ෂ 10ට අඩු | ශ්‍රී.ලං.තා.සේ. පුහුණු/ III/II/I | II/I ශ්‍රේණිය/ පන්තියේ තාක්ෂණ නිලධාරීන්<br>** II/I ශ්‍රේණි වල තාක්ෂණ නිලධාරීන් නොමැති පළාත් පාලන ආයතන වල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වල පුහුණු ශ්‍රේණිය සහ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරීන්ට හැකිය.<br>***එක් තාක්ෂණ නිලධාරියෙකු පමණක් සිටින පළාත් පාලන ආයතනවල එම නිලධාරියා විසින් සකසන ඇස්තමේන්තු පළාත් පාලන ආයතන ප්‍රධානියාට සෘජුවම අනුමත කළ හැකිය. |

ආර්.සී.ද සොයිසා,

ප්‍රධාන ලේකම්,

දකුණු පළාත.

පිටපත් - 01. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මුදල්/පිරිස් හා පුහුණු) - දැ.ගැ.ස

02. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) - දැ.ගැ.ස

03. සහකාර ප්‍රධාන ලේකම් (පාලන/ආයතන/පිරිස් හා පුහුණු) - දැ.ගැ.ස

04. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත - දැ.ගැ.ස

05. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස

06. අයවැය අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස

"විශිෂ්ටතම රාජ්‍ය සේවයක් උදෙසා"


# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
# ஆளுநர் செயலகம்
# GOVERNOR'S SECRETARIAT

දකුණු පළාත, පහළ ඩික්සන් පාර, ගාල්ල
தென் மாகாணம், கீழ் டிக்சன் வீதி, காலி
Southern Province, Lower Dickson Road, Galle.


මගේ අංකය / எனது இல / My No. } G/SP/1/2/1/1/දීම

ඔබේ අංකය / உமது இல / Your No: }

දිනය / திகதி / Date } 2020.02. 27

15 02 MAR 2020 10 ප්‍රධාන ලේකම් දකුණු පළාත. 14 11 12 13

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**<u>ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක CSS/7/3/7 හා 2020.02.12 ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි නිකුත් කරන ලද අංක 11/2019 හා 2019.12.27 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛයෙහි (මුදල්) 3.2 ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල යටතේ ඇති වගුවෙහි අංක 8 යටතේ ඇති ඇස්තමේන්තු මුලා සීමාව රු.ලක්ෂ 10 ට අඩු ඇස්තමේන්තු නිර්දේශ කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියුතු III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරීන්ට හා පුහුණු ශ්‍රේණියේ නිලධාරීන්ටද ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2020.02.25 වන දින ලබා දී ඇති කාරුණිකව දන්වමි.

ඒ.යූ.වේලාරත්න
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත

ඒ.යූ.වේලාරත්න
ආණ්ඩුකාර ලේකම් - දකුණු පළාත
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
පහළ ඩික්සන් පාර,ගාල්ල


ආණ්ඩුකාර ලේකම්/ Governor's Secretary -Tp/Fax 091 2222498 විද්‍යුත් තැපෑල/ E-mail - governsecspc@sltnet.lk
සහකාර ලේකම්/ Assistant Secretary -Tp 091 2226990
නීති නිලධාරී/ Legal Officer -Tp 091 3097160 වෙබ් අඩවිය/ Web site - governer.sp.gov.lk
පරිපාලන නිලධාරී/ Administrative Officer -Tp/Fax 091 2234480